රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2017

මගේ අංකය : EST/6/OFTIM/07/3050
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.11.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## මුරකරුවන්ගේ රාජකාරි වේලාවන්

ඉහත මැයෙන් නිකුත් කර ඇති අංක 309/1/66(ඊටී/සීඒ)235 හා 1949.08.24 දිනැති සහ අංක 309/1/66(ඊටී/සීඒ)303 හා 1949.12.22 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ වෙත ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර මුරකරුවන්ගේ රාජකාරි වේලාව සම්බන්ධයෙන් 2017.12.01 දින සිට පහත විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

I. මුරකරුවන් සතියකට දින 06 ක සේවයට යටත් වන අතර ඉරිදා දින හා රජයේ නිවාඩු දින සාමාන්‍ය රාජකාරි දිනයන් ලෙස සැලකිය යුතුය. ඔවුන්ට සතියකට එක් දිනක් විවේක දිනයක් ලෙස හිමි වේ.

II. එක් සේවා මුරයක රාජකාරි කාලය පැය 09 ක් විය යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියාට සිය අභිමතය පරිදි පැය 12 ක උපරිමයකට යටත්ව එක් සේවා මුරයක රාජකාරි වේලාව නියම කළ හැක.

III. අතිකාල දීමනා ලබා දිය හැක්කේ එක් සේවා මුරයක් තුළ පැය 09 න් ඔබ්බට කරනු ලබන සේවය සඳහා පමණි.

IV. පැය 12 ඉක්මවා මුරකරුවන් සේවයේ යෙදවීම වැලැක්වීම සඳහා මුරසේවයේ යෙදීමට කැමති කනිෂ්ඨ නිලධරයන් ඒ සඳහා යොදා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට කටයුතු කළ හැකි අතර අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ගේ නිත්‍ය තනතුරෙහි රාජකාරි කාලය පදනම් කර ගනිමින් අතිකාල දීමනා ලබා දිය හැකිය.

V. දිනකට සමාන කාලපරිච්ඡේද ලෙස ගැනෙන සේවා මුර 03 ක් ක්‍රියාත්මක වන පරිදි මුරකරුවන් රාජකාරියේ යොදවන්නේ නම් ඔවුනගේ එක් සේවා මුරයක් පැය 08 ක් වන පරිදි සකස් කළ හැකිය.

VI. සේවා මුර ක්‍රමය යටතේ පැය 08 ක සේවා මුරයක් නියම වන නිලධරයකුට වුවද සේවා මුරය තවදුරටත් දිර්ඝ වන අවස්ථාවලදී අතිකාල සඳහා හිමිකම් ලැබිය හැක්කේ පැය 09 ක රාජකාරි වේලාවෙන් ඔබ්බට ඉටු කරන රාජකාරි සඳහා පමණි.

VII. මුරකරුවන්ගේ අතිකාල දීමනා සඳහා ගාස්තු ප්‍රමාණය ගණනය කිරීමේදී ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 6:1 උප වගන්තියෙහි විධිවිධාන අදාළ කරගත යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කෙරේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය